# ඓතිහාසික පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනයක්

**බෝදාගම සුමන හිමි**


## සාරාංශය

ඓතිහාසික ග්‍රන්ථවිද්‍යාව (Historical Bibliography) යනුවෙන් හඳුන්වන්නේ මානව ඉතිහාසයේ මූලාරම්භයේ සිට වර්තමානය තෙක් මිනිසා විසින් භාවිතයට ගත් ලේඛන ද්‍රව්‍ය පිළිබඳව විද්‍යාත්මක ලෙස අධ්‍යයනය කිරීම යි. මානවයා විසින් ප්‍රාථමික යුගයේ සිට නූතනය දක්වා තම සන්නිවේදනය කාර්ය සඳහා විවිධ වූ ක්‍රමවිධි භාවිත කර ඇත. පළමුව හූව, බෙර නාදය, ගස් චිත්‍ර මගින් ද, පසුව ශිලා, මැටිපුවරු, පැපිරස්, පාච්මන්ට්, වෙලම්, පුස්කොළ පොත්, උණපතුරු, රන්, රිදී හා තඹපත්, ලෝහ, රෙදි වැනි ලේඛන මාධ්‍යයන්ගෙන් ද, වර්තමානයේ පොත්, සඟරා, පුවත්පත්, අන්තර්ජාලය සහ නවීන උපාංග ද, සන්නිවේදනය සඳහා භාවිත කරනු ලබයි. පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුට යම්කිසි අදහසක් කිසියම් මාධ්‍යයක් උපයෝගී කරගෙන හුවමාරු කරගැනීම සන්නිවේදනය ලෙස සරලව හැඳින්විය හැකිය. ඉතිහාසය පුරාවටම මිනිසා විසින් සොයාගත් දැනුම හා අත්දැකීම් පරපුරෙන් පරපුරට සන්නිවේදනය කිරීම සඳහා ලේඛන ගත කොට ඇත. පුරාවිද්‍යාඥයින් විසින් සිදු කරන ලද පර්යේෂණ මගින් පුරාතන මෙසපොතේමියානු, ඊජිප්තු, හෝවැංහෝ හා ඉන්දුනිම්න ශිෂ්ටාචාරවාසීන් ස්වභාවික පරිසරයේ තිබූ සම්පත් තම ලේඛන කාර්ය සඳහා උපයෝගී කරගන්නට තරම් දක්ෂ වූ බවට සනාථ කිරීමට සමත් පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් අවශේෂ

සොයාගැනීමට හැකිව තිබේ. මෙහි දී ශ්‍රී ලංකාව, ඉන්දියාව, බුරුමය, චීනය ආදි පෙරදිග රටවල් තල ගසින් සකස් කරගත් පුස්කොළ පොත්, ශිලා, රෙදි, තඹ, රන් හා රිදී පත්, ලේඛනය සඳහා බහුලව භාවිත කර ඇති අතර, මෙසෙපොතේමියාව, ග්‍රීසිය, මිසරය ආදි අපරදිග රටවල් මැටිපුවරු, පැපිරස්, පාච්මන්ට් වැඩි වශයෙන් භාවිත කර ඇත. මෙහිදි පෙරාපරදිග ඉපැරණි මානව ශිෂ්ටාචාරයන්හි අතීත මානවයා තම අදහස් පළ කිරීමට භාවිත කරන ලද ඉපැරණි ලේඛන මාධ්‍යය පිළිබඳ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කෙරේ.

ප්‍රමුඛ පදඃ ඓතිහාසික ග්‍රන්ථවිද්‍යාව, ඉපැරණි ලේඛන මාධ්‍යය, පැපිරස්, පාච්මන්ට්, පුස්කොළ පොත්,

## ශිලා (Stone)

ශිලා (Stone) පෙරාපරදිග භාවිත කළ පැරණි ලේඛන මාධ්‍යයකි. මහින්දාගමන්යෙන් පසුව ලංකාවෙත්, ධර්මාශෝක රජු දවස ඉන්දියාවෙත්, පිරිමීඩ ආශ්‍රිතව ඊජිප්තුවෙත් ශිලා ලේඛනය සඳහා භාවිත කර ඇති බව ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වේ. දැනට ලංකාවේ සොයා ගන්නා ලද සියලු ම සෙල්ලිපි කොටස් පහකට බෙදා දක්වා ඇත.

1. ලෙන්ලිපි
2. ගිරිලිපි
3. ටැම්ලිපි
4. පුවරුලිපි
5. වෙනත්ලිපි[1]

මහින්දාගමනයෙන් පසුව දෙවානම්පියතිස්ස රජු විසින් ලෙන් 68 ක් භික්ෂු සංඝයාගේ වැඩ සිටීම සඳහා නිර්මාණය කර ඇති අතර, එම ලෙන්වල "අගත අනගත චතුදිශ ශගශ දිනෙ" යනුවෙන් සඳහන් ලෙන් ලිපි බොහෝ ප්‍රමාණයක් සෙනරත් පරණවිතාන මහතා විසින් සොයා ගන්නා ලදි. ඒ අනුව මිහින්තලා දෙවන සෙල්ලිපිය, පිච්චන්දියාව සෙල්ලිපි දෙක,



කොල්ලදෙණිය සෙල්ලිපිය පැරණි සෙල්ලිපි ලෙස හඳුනාගත හැකිය.[2] පශ්චාත්කාලීනව තෝනිගල සෙල්ලිපිය, බදුලු ටැම්ලිපිය, මිහින්තලේ සෙල් පුවරු ලිපි, නිශ්ශංකමල්ලගේ අනුරපුර සෙල්ලිපිය, මිණිපේ සෙල්ලිපිය ආදි වශයෙන් ඉහත දක්වා ඇති අයුරින් ශිලා විවිධාකාරයෙන් ලේඛනය සඳහා භාවිත කර ඇති බවට නිදසුන් වේ.

ඉන්දියාවේ අශෝක රජු දවස බෞද්ධ ධර්ම කරුණු ඇතුළත් ශිලාස්ථම්භ විශාල ප්‍රමාණයක් මුළු ඉන්දියාව පුරා ම පිහිට වූ බව ඉතිහාසයේ සඳහන් ය. එම ධර්මය ආශෝක ධර්මය ලෙසත්, ස්ථම්භ අශෝක ශිලාස්ථම්භ ලෙසත් ප්‍රචලිත ය. මීට අමතරව ඊජිප්තුවාසීන් විසින් ද සිනිඳු කෙටීම් මගින් පිරිමීඩ ආසන්නයේ සිහිවටන ශිලාස්ථම්භ නිර්මාණය කර ඇති අතර ඒවා "Obelisks" යන නාමයෙන් හඳුන්වනු ලැබේ. වර්ෂ 1880 දී ඊජිප්තුවෙන් රැගෙන යන ලද නිව්යෝර්ක් නගරයේ ප්‍රධාන උද්‍යාන භූමියෙහි ස්ථාපනය කර ඇති "සිහිවටන ශිලාස්ථම්භය" මේ සඳහා නිදසුන් වේ. එම සිහිවටන පුවරුව "Cleoptra's Needle" යන නාමයෙන් ලොව පුරා ප්‍රසිද්ධය.[3] මේ අනුව සෑම ඉපැරණි මානව ශිෂ්ටාචාරයක ම "ශිලා" (Stone) ලේඛනය සඳහා භාවිත කර ඇති බව පෙනේ.

## මැටිපුවරු (Clay Tablets)

මැටිපුවරු ලොව ඉපැරණිතම ලේඛන මාධ්‍යයකි. පුරාණ යුප්‍රටීස්-ටයිග්‍රීස් ගංගා දෙකට මැදිව බිහි වූ මෙසෙපොතේමියානු ශිෂ්ටාචාරවාසීන් වන සුමේරියන්වරුන් විසින් ලේඛන මාධ්‍යයක් ලෙස මැටිපුවරු බහුලව භාවිත කර ඇත. මෙම ප්‍රදේශය ගංගා දෙකකට මැදිව පිහිටි නිසා ලේඛන අමුද්‍රව්‍ය සුලභ විය. ශිෂ්ටාචාරවාසීන් විසින් තෙත මැටි ගෙන එයින් පුවරු සාදාගෙන, එම තෙත මැටි වියළීමට පෙර ඒ මත විවිධ රූප සටහන් ඇඳ (Pictographs) එමගින් තම අදහස් ප්‍රකාශ කර ඇත. විද්‍යාඥයන් පවසන පරිදි රොන් මඩ, පෙරනයක් උපයෝගී කරගෙන ඉතා සියුම් රොන් මඩ රැගෙන මැටිපුවරු සකස් කර ඇත. මෙම චිත්‍ර මගින් නොයෙක් අදහස් ඉදිරිපත් කර ඇත.

* ගවයෙක්, බැටලුවෙක්, කුඩයක් මගින් ගනුදෙනුවක්
* මිනිසෙකුගේ පය ඇඳීම මගින් ඇවිදීම
* හිරු ඇඳීමෙන් රශ්මිය හෝ දින
* සමාන ඉරි තුන ඇඳීමෙන් ගංගාවක් නිරූපණය කර ඇත.[4]

රූපය මගින් තම අදහස් ඉදිරිපත් කළ මිනිසා ඉනික්බිතිව අක්ෂර මගින් අදහස් ඉදිරිපත් කරන්නට තරම් දක්ෂ විය. එම අක්ෂර කෙටි රේඛාවලින් යුක්ත වූ නිසාත්, කූඤ්ඤ ස්වරූප ගත් නිසාත් කූඤ්ඤාක්ෂර (Cuneiform) ලෙස හඳුන්වා ඇත. අක්ෂරකරණය සඳහා උල් ආයුධයක් වැනි යමක් භාවිත කර ඇත. මැටිපුවරු වියළා ගැනීම සම්බන්ධව ද නොයෙක් මතවාද පවති. මෙහිදී පළමුව දැඩි හිරු රැසින් මැටිපුවරු වියළා ගැනීමට යාමේදී පිපිරීම්වලට ලක් වීම නිසා එකී ක්‍රමය අත්හැර දමන්නට ඇති බව ඇතැමෙක් පවසති. පසුව මද ආලෝකයෙන් වියළා ගෙන තැන්පත් කර ඇති අතර, පසුව උද්ගත වූ පාරිසරික හා කෘමි උවදුරුවලින් ආරක්ෂා කර ගැනීමට මැටිපුවරු ගින්නේ පුළුස්සා සකස් කර තැන්පත් කර තිබේ. මෙම කාලවකවානුවේ දී අසුරුබානිපාල් අධිරාජ්‍යයාගේ නිනාවේ (Nineveh) පිහිටි පුස්තකාලයෙන් මැටිපුවරු 30000 කට වඩා හමුවීමෙන් ලේඛන මාධ්‍යයක් ලෙස මැටිපුවරු බහුලව භාවිත කර ඇති බව පැහැදිලි ය.[5] මෙම මැටි පුවරුවල මෙසෙපොතෙමියානු දෙවියන්, වීරවරුන්ගේ කතා, සාහිත්‍යය, රාජ්‍ය පරිපාලනය හා වෙළදාම පිළිබඳ කරුණු ඇතුළත් වේ.

## පැපිරස් (Papyrus)

මිසරයේ නයිල් ගඟ සමීපයේ ජීවත් වූ පේරෝවරු නයිල් නිම්න ශිෂ්ටාචාරයෙහි ආදිතමයෝ වූහ. ඔවුන් ජීවත් වූ නයිල් නිම්නයේ පැපිරස් නම් පත් වර්ගයක් සාරවත්ව වැඩුන අතර, පේරෝවරුන් ක්‍රි. පූ 3000 දී එම පැපිරස් පත්‍ර උපයෝගී කරගනිමින් නව ලේඛන මාධ්‍යයක් ලොවට හඳුන්වා දී ඇත. පැපිරස් පත්‍රය සුලභව තිබීමත්, කල් පවත්නා ගුණයත් නිසා



ලේඛන මාධ්‍යය නව දිශානතියකට යොමු වූ බව පෙනේ. මෙම පැපිරස් ශාඛය සුළභව තිබූ නිසා සියවස් ගණනාවක් මිසරයේ හා ග්‍රීසියේ ප්‍රධාන ලේඛන අමුද්‍රව්‍ය බවට පත් විය. පැපිරස් ගස අඩි 10-15 ත් පමණ උසට වැඩෙන ශාඛයකි. පැපිරස් පත්‍රයක කෙඳි තිරස්ව හා සිරස්ව පිහිටා ඇති බැවින් ශක්තිමත් බවින් යුක්ත ය. සකස් කර ගත් පැපිරස් පත්‍රයක පළල අඟල් 2 සිට 3 දක්වා යුක්ත වන අතර මැටි පුවරුවකට වඩා බොහෝ කරුණු අන්තර්ගත කිරීමේ හැකියාව හා ලේඛනගත කිරීමේ පහසුව නිසා දීර්ඝ කාලයක් ලේඛන මාධ්‍යයක් ලෙස භාවිතයට ගෙන ඇත. ඊජිප්තුවාසීන් විසින් පැපිරස් අමුපත්‍ර කිහිපයක් තිරස්ව හා සිරස්ව එක මත එක තබා නයිල් නිම්නයෙන් ලබා ගත් විශේෂ සියුම් මැටි වර්ගයකින් තනාගත් විශේෂ ආලේපනයක් පැපිරස් පත්‍රමත ආලේපනය කර, තෙත් කිරීමෙන් හා පීඩනය ලබා දෙමින් පදම් කර හිරු එළියෙන් වේළාගෙන, ඇත්දළ හා පාෂාණ භාවිතයෙන් ඔපමට්ටම් කර සුමට ලේඛන මාධ්‍යයක් (ද්‍රව්‍යයක්) බවට පැපිරස් පත්‍ර සකස් කරගෙන ඇත.[6]

පැපිරස්පත්‍ර වියළා ගත් පසු බොර පැහැති වර්ණයකින් සමන්විත වේ. පැපිරස්පත්‍ර මත ලිවීමේ දී උල් තුඩක් සහිත උපකරණයක් භාවිත කර ඇති අතර, කළු පැහැති කුඩු විශේෂයක් පැපිරස් පත්‍ර මතුපිට තවරා ගැනීමෙන් ලියන ලද දෑ පහසුවෙන් කියවීමට හැකි වන පරිදි සකස් කරගන්නට නයිල් නිම්නවාසීහු දක්ෂ වූහ.

පැපිරස්පත් යොදා ගනිමින් රචිත ලේඛන බොහෝ ය. චිත්‍ර, කාව්‍යය, රාජ්‍ය නීති, ග්‍රන්ථ ආදි විවිධාංගීකරණයෙන් බිහි වූ පැපිරස් ලේඛන සාහිත්‍යය ලෝක පුස්තකාල ඉතිහාසයේ තවත් එක් සන්ධිස්ථානයක් බවට පත් විය. ඒ අතුරින් කිහිපයක් පහතින් දක්වා ඇත.

- හෝමර්ගේ ඉලියට් කාව්‍ය (පැපිරස් රෝල් 24)
- රැම්සීස් රජුගේ හැරිස් පැපිරස් (Harris Papyrus) එකතුව (මෙම රජුගේ පුස්තකාලයේ පැපිරස් රෝල් 20,000 ක් පමණ තිබී ඇත.)

- ❖ පිරමීඩ්වල තැන්පත් කළ මළවුන්ගේ ග්‍රන්ථ (මළවුන්ගේ ග්‍රන්ථයක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් කර ඇත. එය දිග අඩි 78 ක් හා පළල අඟල් 15 ක් පමණ වේ.)
- ❖ ග්‍රීසියේ රජ කළ දෙවන ඉයුමිනස් රජුගේ රාජ්‍ය පරිපාලන යුගයේ දී, පර්ගමම් පුස්තකාලයේ පැපිරස් රෝල් ලක්ෂ 2 ක් පමණ තිබූ බව Plutarch නම් තැනැත්තා සඳහන් කර ඇත.[7]

## පාර්ච්මන්ට් (Parchment)

මානව ලේඛන ඉතිහාසයේ නව ලේඛන ද්‍රව්‍යයක් වන "පාච්මන්ට්" සොයා ගැනීම තවත් එක් වැදගත් පියවරකි. බැටළුවන්, එළුවන්, ගවයන් වැනි සත්ත්වයන්ගේ සම් භාවිත කරමින් නිර්මිත පාර්ච්මන්ට් වැඩි වටිනාකමක් සහිත ලේඛන ද්‍රව්‍යයක් විය. එයට හේතුව වනුයේ සත්ත්ව හම් මේ සඳහා යෝදා ගැනීම යි. මෙහි ඉතිහාසය විමසා බැලීමේ දී පර්ගමම්හි රජ කළ දෙවන ඉයුමිනස් රජු පර්ගමම් පුස්තකාලය සංවර්ධනය කිරීමට විශාල වශයෙන් උගතුන් ලවා ග්‍රන්ථ රචනා කරවන්නට විය. හෙතෙම පළමුව පැපිරස් පත්‍ර ඊජිප්තුවෙන් ආනයනය කළ අතර, පසුකාලීනව ඊජිප්තුවේ එවකට රජකම් කළ ටොලමි රජු විසින් පැපිරස් ග්‍රීසියට අපනයනය කිරීම සීමා කරන ලද්දේ ඇලෙක්සැන්ඩ්‍රියා පුස්තකාලයට වඩා තවත් විශාල පුස්තකාලයක් බිහි වෙනු දැකීමට තිබූ නොකැමැත්ත හේතුවෙනි.[8]

එම ලේඛන ද්‍රව්‍ය හිඟයට පිළියමක් ලෙස පාර්ච්මන්ට් නමැති නව ලේඛන මාධ්‍යය ලොවට හඳුන්වා දෙන්නට දෙවන ඉයුමිනස් රජුට හැකිවීම පර්ගමම් පුස්තකාලයේ දියුණුවට හේතු විය. පාර්ච්මන්ට් සකස් කිරීමේ දී සත්ත්ව හම් මනාව පදම් කරගැනීමෙන් අනතුරුව හතරැස් කොටු ආකාරයෙන් කපාගෙන, කපා ගත් සෑම කොටසක ම පැත්තකින් සිදුරක් සකස් කරනු ලබයි. ඉන් අනතුරුව එම කොටස් එක මත තබාගෙන හම් පටියක් සිදුරු අතරින් යවා බැඳ පොතක් මෙන් සකසා ගැනීම සිදු කෙරේ.[9]



## වෙලම් (vellum)

වෙලම් (vellum) ළදරු බැටලු, හරක්, එළුවන්ගේ සම් අමුද්‍රව්‍යයක් ලෙස යොදාගනිමින් සකස් කරනු ලබන සුමට ලේඛන ද්‍රව්‍යයකි. මෙහි දී පැටවුන් වැදීමට ආසන්න බැටළු දෙනුන් මරා නූපදින බැටළු පැටවුන් එළියට රැගෙන ලබා ගන්නා හම් මගින් "වෙලම්" බහුලව සකස් කර ඇති බවට පැහැදිලි සාක්ෂි වේ. "වෙලම්" දුර්ලභ, මෘදු මතුපිටක් සහිත, ළදරු සත්ත්ව සම් භාවිතයෙන් සකස් කරන, විශේෂ ලේඛන සඳහා උපයෝගී කර ගන්නා ලද ලේඛන මාධ්‍යයක් ලෙස හැඳින්වේ. දුර්ලභ නිසා හසුන් පත් යැවීම, දේපළ පිරිනැමීම, සංදේශ හෝ ගිවිසුම්වලට එළඹීම, රාජ්‍ය තාන්ත්‍රික ගණුදෙනු වැනි දුර්ලභ කාර්යයන් සඳහා පමණක් භාවිතයට ගෙන ඇති බවක් දැකිය හැක.[10]

## රන්, රිදී හා තඹ පත් (Gold, Silver and Copper sheats)

රන්, රිදී හා තඹ පත් විදේශ රාජ්‍යයන් සමග පණිවිඩ හුවමාරුව, ගෞරව නාම පිරිනැමීම, රාජකීය ලේඛන, විහාරාරාම පූජා කිරීම ආදි වැදගත් ලේඛන කාර්ය සඳහා භාවිත කර ඇත. කැලණිතිස්ස රජතුමා විසින් තෙර නමක් තෙල් කටාරමක දමා ඝාතනය කිරීමෙන් සිදු වූ විනාශය වළක්වා ගැනීමට දේවී නම් තම දියණිය යාත්‍රාවක නංවා මුහුදේ පා කර හැරීමේ දී ඇය රාජ දියණියක් බව සටහන් රන්පතක් ද එහි තැන්පත් කළ බවක් මහාවංසයේ දක්වේ.[11]

මෑතකදී ජේතවනයේ සිදු කළ කැනීම්වල දී රන්පත් හතක් (07) හමු වූ අතර එම රන්පත්හි මහායානික සූත්‍රයක් වන ප්‍රඥාපාරමිතා සූත්‍රය ලේඛනගත කර තිබීමෙන් එකල නිධන් වස්තු ලෙස ධර්මපාඨ සහිත රන්පත් තැන්පත් කළ බවක් පෙනේ. මීට අමතරව නිශ්ශංකමල්ල රජතුමා විසින් ලිපි ලේඛන හා හසුන්පත් ලිවීමට තඹ හා රන්පත් භාවිත කර ඇති බව ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වේ. විශේෂයෙන් ම විවිධ පරිත්‍යාග සම්බන්ධව තඹපත් භාවිත කර ඇති අතර එකී ප්‍රදානයන් පිළිබඳ

මහාවංසයෙහි මෙසේ දක්වා ඇත. "දස්කම් කළ වූනට දෙන හිරසන්ද පමුණුවෙයන් මියන් කන පනැලියා දියෙහි හිරි සේ අස්ථිර නොකොට පස්වා දහසකට පවත්නා පරිද්දෙන් තාමු සාසන ලංකාවේ පවත් කොට එසේම ලේඛන කලාව දියුණු කරලීමේ අරමුණින් විවිධ ලේඛනයන්ට විවිධ උපාධි නාම පරිත්‍යාග කරන ලදි" යනුවෙන් දක්වා ඇති අතර මෙයින් ලේඛනයේ යෙදෙන්නවුන් සඳහා උපාධි නාම ලබාදෙමින් ඔවුන් දිරිමත් කළ බවක් දක්වා ඇත.[12] අපදිග රටවල්වල ද වෙළඳ ගිවිසුම්, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හා නිල කාර්යයන් සඳහා රන්, රිදි හා තඹපත් භාවිත කර ඇත.

## පුස්කොළ (Palm Leaves)

පුස්කොළ ආසියාතික රටවල්වල වඩාත් ජනප්‍රිය ලේඛන කලාවකි. ශ්‍රී ලංකාව, ඉන්දියාව ප්‍රධාන කරගත් ආසියාතික රටවල පුස්කොළ පොත් බෙහෙවින් ජනප්‍රිය ලේඛන ප්‍රභවයක් විය.[13] 19 වන සියවසේ සිංහල - ඉංග්‍රීසි ශබ්දකෝෂය සකස් කළ බෙන්ජමින් ක්ලප් නැමැත්තා "පුස්කොළ පොත" නිර්වචනය කර ඇත්තේ "ලිවීමට හෝ සීරීමට උල් කටුවෙන් පිළියෙළ කර ගන්නා ලද හිස් කොළය" යනුවෙනි. පුස්කොළ යන පදයෙහි තේරුම ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ දී "පුස්කොළ පොත් " (කඩිබා 1115) යන්න අර්ථ දක්වන්නේ කිසිවක් නොලියූ හිස් තල් කොළය යනුවෙනි.[14]

මෙරට අඩි 3000 ට වඩා උස ප්‍රදේශ වල තල ගසත්, ඊට වඩා අඩු උස ප්‍රදේශ වල තල් ගසත් සුලභව වැවෙන තාල ගස් විශේෂයකි. මෙම තාල ශාඛ ලිවීම සඳහා අනාදිමත් කාලයක සිට මිනිසා විසින් භාවිත කර ඇති අතර, කොළවල ස්වභාවිකව ම පිහිටි ශක්තිමත් තිරස් හා සිරස් කෙඳි නිසා ම ලේඛන ද්‍රව්‍යයක් ලෙස භාවිතයට ගන්නට ඇත. තල කොළය තල් කොළයට සාපේක්ෂව දිගින් සහ පළලින් විශාල ය. එසේ ම තල හා තල් පැදුරු, වට්ටි ඇතුළු එදිනෙදා භාවිත කරන උපකරණ සකස් කරන්නට ප්‍රධාන අමුද්‍රව්‍යය ලෙස යොදා ගෙන ඇත. පසුකාලීනව තල් කොළය, තල කොළයට වඩා ලේඛන කාර්ය



සඳහා වඩාත් උචිත බව වටහා ගන්නා ලද බව දැනට ශේෂ පුස්කොළ පොත්වලින් පැහැදිලි ය. මේ අනුව පුස්කොළ,

1. තල කොළ පුස්කොළ පොත්
2. තල් කොළ පුස්කොළ පොත්

යනුවෙන් දෙයාකාරව හඳුනා ගත හැකිය. මෙහි දී තල්පතින් පුස්කොළ පොතක් සකස් කර ගන්නා අයුරු විස්තර කෙරේ. පුස්කොළ සකස් කිරීමේ දී ඒ සඳහා ම වත් පිළිවෙත්, නව සංස්කෘතික ලක්ෂණ බිහි වී තිබේ. මෙහි දී පළමුව තලගොබය ඉහිරෙන්නට ආසන්නවත් ම එය ගසෙන් ඉවත් කර ගන්නේ සකස් කර ගත් සුභ නැකත් වේලාවකට ය. තලගොබය කපන තැනැත්තා දින තුනක් ජේවී, තල ගහ අද්දර මල් පැලක් ඉදිකොට දේවතාවන් උදෙසා පහන් පත්තු කර, තලගොබය කැපීමේ වත් පිළිවෙත් ආරම්භ කරයි. තලගොබය කපන පුද්ගලයා සුදු ඇඳුමින් සැරසීම ද, ජටාවක් දැරීම ද, බාහිර ශබ්ද ඇති නොවීමට ද හේ වග බලා ගනී. නියමිත වේලාවට පෙර තල ගසට වැද නැකැත් වේලාවට තලගොබය කපා බිම නොගැවෙන සේ සුදුසු තැනක තබයි.

තල ගොබය සුදුරෙද්දක් ඇතිරූ ආසනයක තැන්පත් කර පත්ඉරු වෙන් කිරීම සිදු කරයි. ඉන් අනතුරුව එක් එක් පත්‍රවල ඉරටු ඉවත් කරනු ලබයි. පසුව තලකොළ ක්‍රමයෙන් එක් දිශාවක සිට අනෙක් දිශාව දක්වා ඔතා රෝල් කර, කුඩා කෙන්දකින් බඳිනු ලැබේ. මෙම රෝල් "වට්ටු" ලෙස හැඳින්වේ. සකස් කර ගත් "වට්ටු" අළුත් තඹ හෝ මැටි මුට්ටියක කුඩා අන්නාසි ගැට, අන්නාසි කොළ, ගස්ලබු කොළ හා ගැට, අමු කහ සහ ඊට අදාළ ද්‍රව්‍ය දැමූ වතුරේ රන්වන් පැහැ ගැන්වෙන තුරු තම්බා තිවෙන්නට හැර හැලියෙන් ඉවත් කර වියන ලද පොල්අතු මත දින තුනක් තද අව්වේ ද, මද පවනේ හා මද පින්නේ දින තුනක් ද තබා වේලා ගනී.

25 MAY 2022

**කඳ මැදීම** : කඳ මැදීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ තැම්බූ පුස් කොළ පදම් කර ගැනීම යි. ඒ සඳහා පිරිසිදු කරන ලද පුවක් කඳක් උපයොගී කර ගනී. පුස්කොළය සිනිඳු වී ලිවීමට හැකියාවක් සහිත වන තෙක් කඳ මැදීම සිදු කරයි. අනතුරුව ලේඛන අවශ්‍යතාව මත ''වියත් 1, වියත් 2, වියත් 3'', වශයෙන් කොටස්වලට කපා ගැනීම සිදු කරයි. මෙහි වියත - වෙද පොත් සඳහා ද, වියත් දෙක - ඉතිහාස පොත් රචනය සඳහා ද, වියත් තුන - ධර්ම ග්‍රන්ථ රචනා කිරීමට ද භාවිත කර තිබේ. මෙසේ කොටස් කර ගත් ''පත්ඉරු'' රත් කරන ලද යකඩයෙන් කෙළවර පුළුස්සා පදම් කර ගනී. එමගින් අභ්‍යන්තර සාන්ද්‍රිය දියරවලින් හා මූෂිකාදීන්ගෙන් වන බලපෑම් අවම කර ගැනීමට හැකියාව ඇත. පුස්කොළවල ආරක්ෂාව සඳහා කොහොඹ, බුරුත, කොස් ආදි දැවවලින් අලංකාර පොත් කම්බාව අලංකාර චිත්‍ර, ලියවැල් භාවිතයෙන් අලංකෘතව සකස් කර ගැනීමෙන් පුස්කොළ පොතේ සංස්කෘතික වටිනාකම විදහා දක්වයි.

**පුස්කොළ ලේඛනය**: කිසිවක් නොලියන ලද තල්කොළ එකතුව "පුහුපොතක්" ලෙස හඳුන්වයි. පුස්කොළ ලේඛනයේ දී පන්හිඳක් හෝ යකඩ තුඩක් සහිත උපකරණයකින් ''හංස, ගජ, කාක, සිංහ'' යන අක්ෂර ශෛලීන් උපයෝගී කරගනිමින් වමේ සිට දකුණට ලියනු ලබයි. පුස්කොළ ලිවීම සඳහා භාවිත කරන පන්හිඳ යකඩ, වානේ, තඹ, පිත්තල යන අමුද්‍රව්‍ය යොදා කැටයම් හා අලංකාර සහිතව නිර්මාණය කෙරේ.

**කළු මැදීම**: පුස්කොළ පොත්වල ලිඛිත අකුරු මතු කර ගැනීම සඳහා "කළු මැදීම" සිදු කෙරේ. මේ සඳහා ගැඩුඹ ගසින් පුළුස්සා ගත් අඟුරු සිහින්වන සේ අඹරා ගෙන, සුදු කැකුණ ඇට තෙල් සහ දුම්මල තෙල් සමග මිශ්‍ර කර ද්‍රාවණයක් ලෙස සකසා තලපත් මත ආලේපනය කරනු ලබයි. ඉන් අනතුරුව සියුම්ව සකස් කර ගත් කුරක්කන් පිටි තලපත් මත තවරා රෙදි කඩකින් පිරිසිදු කෙරේ. එමගින් පුස්කොළ පොතට දීප්තිමත් ස්වභාවයක් හා අතිරික්ත තෙල් උරා ගැනීම සිදු වේ.



ඉන් අනතුරුව පොත් කම්බා, හුයක් භාවිතයෙන් පුස්කොළ පොත බැඳ සකස් කරයි. අලංකෘතව සකස් කර ගන්නා ලද පොත් කම්බා අතර තලපත් තබා, කපු නූලෙන් සකස් කරන ලද දිග " හුයක්" සිදුරු අතුරින් යවා බැඳ ගැනීම සිදු කරයි. ඉන් අනතුරුව හුය "පොත් කම්බාවේ" හිර කිරීම සඳහා "සකිය" ක් ඇත් දළ, ලී, තඹ, පිත්තල වැනි ලෝහ, පොල්කටු වැනි අමුද්‍රව්‍යයක් භාවිත කර නිර්මාණය කර ගනී. මෙසේ සකස් කර ගත් පුස්කොළ එකතුව " පුස්කොළ පොතක්" ලෙස හඳුන්වනු ලබයි.

## අනෙකුත් ඉපැරණි ලේඛන මාධ්‍යයන් (Other Old Writing Materials)

ඓතිහාසික ලේඛන ඉතිහාසය විමසීමේ දී වැදගත් රාජ්‍ය දෙකක් ලෙස චීනය හා ජපානය හැඳින්විය හැකිය. විශේෂයෙන් චීනයේ සේද රෙදි, උණ බම්බු ලේඛනය සඳහා යොදා ගෙන ඇත. මෙම ලේඛන ද්‍රව්‍ය වර්ග දෙක ම මෙම රටවල් විසින් විශේෂ කාර්යන් සඳහා භාවිත කර ඇති බව පෙනේ. රෝමයේ ආගමික ග්‍රන්ථ රචනා කිරීම සඳහා "ලිනන් පිළි" ලේඛන ද්‍රව්‍යයක් ලෙස යොදා ගත් බව Maser නම් ඉතිහාසඥයා සඳහන් කරයි. එම ග්‍රන්ථ Juno Macer නම් දේවස්ථානයේ තැන්පත් කර බව එහි සඳහන් වේ.[15]

මීට අමතරව උතුරු ඇමරිකානුවන් විසින් උතුරු සමශීතෝෂ්ණ කලාපයට අයත් බෙටුලා ගණයේ ශාඛයක් වන (brich) ශාඛයේ පොතු ලිවීම සඳහා උපයෝගී කර ගෙන ඇත.[16] බොහෝ රටවල් සිදරන්, ජම්බෝල වැනි ඇඹුල් ගස්වල ලී, ඇත්දත් පුවරු, වැටකේ පත්, ආදි විවිධ ද්‍රව්‍යය ලිවීම සඳහා යොදා ගෙන ඇති අතර මෙම විවිධාංගීකරණ ලේඛන මාධ්‍යය දැනුම පරපුරෙන් පරපුරට සන්නිවේදනය කිරීමට සමත් විය. ක්‍රි.ව 105 දී පරණ රෙදි කැබලි, ලී පොතු කොටා මිශ්‍ර කර කඩදාසිය නමැති නව ලේඛන ද්‍රව්‍යය සායිලූං නම් චීන ජාතිකයා ලොවට හඳුන්වා දීමත්, ක්‍රි.ව 868 දී චීන ජාතික වැංචියේ මුද්‍රණ යන්ත්‍රයක් හඳුන්වා දීමත්, ක්‍රි.ව 1456 දී ජොහැන්ස් ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ

යන්ත්‍රයක් හඳුන්වා දීමත් නිසා සියවස් ගණනක් පුරාවටම මුද්‍රිත ද්‍රව්‍යය (කඩදාසිය) ලොව ප්‍රධානතම ප්‍රකාශන මාධ්‍යය විය. මෙහි දී චැංචියේ වජ්‍ර සූත්‍රය පළමුව මුද්‍රණය කළ නමුත්, ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීමේ ගෞරවය ජොහැන්ස් ගුටෙන්බර්ග් හට හිමි වේ. ඔහු විසින් ක්‍රි.ව 1456 අගෝස්තු මස 15 වන දින පේලි 42 කින් යුත් බයිබලය මුද්‍රණය කිරීම ලේඛන ඉතිහාසයේ අද්විතීය සිදුවීමකි.

## සමාලෝචනය

ඉපැරණි ලේඛන මාධ්‍යය පිළිබඳ කරනු ලබන අධ්‍යයනය ඓතිහාසික ග්‍රන්ථවිද්‍යාව ලෙස හැඳින්වේ. මානවයා නොයෙකුත් ශිෂ්ටාචාරයන්හි දී තම අදහස් ප්‍රකාශ කිරීමට, ලියා දැක්වීමට භාවිත කරන ලද ලේඛන මාධ්‍යය රාශියකි. මෙහි දී ලේඛන මාධ්‍යය කලාපය, භූමිය, ආර්ථිකය හා දේශගුණය අනුව වෙනස් වන ආකාරය, මානව ශිෂ්ටාචාරයේ දියුණුම ලේඛන ගත කිරීම සඳහා භාවිත ඉපැරණි ලේඛන මාධ්‍යයන්හි සම්භවය හා විකාශනය පිළිබඳ කරුණු සාකච්ඡා කර ඇත.

## ආන්තික සටහන්

1 අමරවංශ හිමි, කොත්මලේ (2014) ලක්දිව සෙල් ලිපි, කොළඹ: ගොඩගේ. පි. 10

2 එම. පි. 12

3 Hunter, E.J. (2009) Classification made simple, 3rd ed. Burlington: Ashgate Publishing. p.8-9

4 වීරසිංහ, එම්. කේ. (2001) පුස්තකාල ඉතිහාසය, කර්තෘ ප්‍රකාශන, කැලණිය. පි.4-5

5 Britishmuseum.org, Assurbanipal Library Phase I

6 වීරසිංහ, එම්. කේ. (2001) පුස්තකාල ඉතිහාසය, කර්තෘ ප්‍රකාශන, කැලණිය. පි.10-11

7 එම., පි. 12-26

8 එම., පි. 27



9 Reed R. (1972) Ancient Skins, Parchments and leathered in Physics Research B 268 (7–8): 1038–4

10 Hunter, E.J. (2009) Classification made simple, 3rd ed. Burlington: Ashgate Publishing. p.12-15

11 ඌන පූරණ සහිතො මහාවංසො (1995) පොල්වත්තේ බුද්ධදත්ත හිමි (සංස්.), කොළඹ: ගුණසේන. පි. 115

12 එම., පරි 78 : ගාථා. 495)

13 ලගමුව, ආරිය (2006) ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තුමේන්තුව. පි. 57

14 සුමංගල හිමි, වැලිවිටියේ (1951) ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, මරදාන: අනුලා මුද්‍රණාලය. පි. 592

15 වීරසිංහ, එම්. කේ. (2001) පුස්තකාල ඉතිහාසය, කර්තෘ ප්‍රකාශන, කැලණිය. පි. 38-44

16 Hunter, E.J. (2009) Classification made simple, 3rd ed. Burlington: Ashgate Publishing. p.12